# සර්වජන ඡන්ද බලය ලැබීමෙන් පසු කාන්තා අයිතිවාසිකම් වල තත්ත්වය ( ගම්පහ දිස්ත්‍රික්කය ඇසුරින්)

එල්. එච්. සී. දිල්රුක්ෂි[1]

## සංක්ෂේපය

නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමට අත්‍යවශ්‍ය උපකරණයක් ලෙස සර්වජන ඡන්දබලය හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාවට සර්වජන ඡන්දබලය හඳුන්වා දෙන ලද්දේ, 1931 වර්ෂයේදී ය. කාන්තා අයිතිවාසිකම් දිනා ගැනීමේ ක්‍රියාදාමයේදී සර්වජන ඡන්ද බලය ඉතා වැදගත් වේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ, සර්වජන ඡන්දබලය ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට හිමිවිය යුතු අයිතිවාසිකම් කොපමණ දුරකට ප්‍රායෝගික තත්ත්වයේදී හිමිව තිබේද යන්න අධ්‍යයනය කිරීමයි. සර්වජන ඡන්ද බලය හිමිවීමෙන් පසු කාන්තාවන්ගේ අයිතිවාසිකම් වල වෙනසක් සිදු වී තිබේද, නැද්ද යන්න මෙම අධ්‍යයනයේ ගැටලුව වේ. අධ්‍යයනයේ නියැදිය ලෙස ශ්‍රී ලංකාවේ වැඩිම දෙවන ජනගහනය මෙන්ම සෑම ජනවර්ගයක්ම නියෝජනය වන ගම්පහ දිස්ත්‍රික්කය තෝරාගත් අතර අතර ප්‍රශ්නාවලි මඟින් ප්‍රාථමික දත්ත හා තොරතුරු සපයා ගන්නා ලදී. කාන්තා අයිතිවාසිකම් විශ්ව ව්‍යාප්ත මට්ටමින් දැකිය හැකි වුවද, ශ්‍රී ලංකාවේ කාන්තා අයිතිවාසිකම් පිළිබඳව පමණක් අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනය හරහා සිදු කොට තිබේ. අධ්‍යයනයෙන් අනාවරණය කර ගත් අන්දමට කාන්තාවන්ගේ ඡන්දය භාවිත කිරීමේ අයිතිය සැලකිය යුතු ප්‍රමාණයකින් භුක්ති විඳීමට හැකියාව ලැබී තිබුණ ද ක්‍රියාකාරී දේශපාලනය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය අවම මට්ටමක පවතී. ඒ අනුව මෙම අධ්‍යයනය හරහා සර්වජන ඡන්දබලය ලැබීමෙන් පසු කාන්තාවන්ගේ අයිතිවාසිකම් යම් තරමක් හිමි වුව ද එය සැලකිය යුතු මට්ටමකින් වර්ධනය වීමක් දැකිය නොහැකි බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** සර්වජන ඡන්දබලය, නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය, කාන්තා අයිතිවාසිකම්

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, cdilrukshi64@gmail.com